INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**2019 පෙබරවාරි 25**

**මාධ්‍ය නිවේදනය: වධහිංසා කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබන නම් දැරූ අපරාධකරුවන් විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට කාලයයි**

**ජොහැන්නස්බර්ග්:** තවමත් සිදුකෙරෙන වධබන්ධන ගැන පියවර ගැනීම පිළිබඳව බරපතල කොට සලකන්නේ නම්, ශ්‍රී ලංකාව විසින් කළ යුත්තේ වධහිංසාවට සම්බන්ධ බවට එක්සත් ජාතීන්ගේ වාර්තා වල නම් කොට ඇති ප්‍රකට ආරක්ෂක නිලධාරීන් ගණනාවකගේම සේවය අත්හිටුවා විමර්ශන ආරම්භ කිරීමයි. අතීතයේ සිදුවූ මෙන්ම දිගටම සිදුවෙමින් පවතින වධහිංසාව ද, වාර්තා කිහිපයකින්ම වධකයන් ලෙස චෝදනා ලබා සිටින්නන් දණ්ඩ මුක්තිය භුක්ති විඳීමද සැලකිල්ලට ගත් කල, වධහිංසාව "කිසිසේත් නොඉවසන" ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති ආණ්ඩු කරන
නොපැහැදිලි ප්‍රකාශ අර්ථ විරහිත වෙයි.

අතිශයින් කුරිරු වධබන්ධන පැමිණවීම සම්බන්ධයෙන් චෝදනා ලබන 47 දෙනකුගේ නම් එක ආරක්ෂක ඒකකයකින් පමණක් ශ්‍රී ලංකාවේ සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) විසින් හඳුනාගෙන තිබේ. මේ, දෙමළ රැඳවියන් ලිංගික වශයෙන් දූෂණය කළ බවට චෝදනා ලබන (විදේශයක පුහුණුව සඳහා මෑතදී යවන ලද්දකුද ඇතුළුව) ශ්‍රී ලංකා යුද හමුදාවේ ගණනාවකට ද, ශ්‍රී ලංකා නාවික හමුදාවේ වධකයන් ලෙස චෝදනා ලබන්නන්ට ද අමතරවය. චූදිත එක අපරාධකරුවකු දැනට විදේශීය තානාපති කාර්යාලයක සේවයෙහි යොදවා සිටින අතර තවත් දෙදෙනකු මෑත කාලයේ වාසය කළේ ඕස්ට්‍රේලියාවේය.

*"පිටරටක ඉඳගෙන ඉන්නා අපට මේසා විශාල සාක්ෂි ප්‍රමාණයක් එකතු කර ගත හැකි නම්, රට තුල හිඳිමින් නිසි විමර්ශන බලතල සහිතව ස්වාධීන අධිකාරියකට වාර්තා කරන විශ්වසනීය කණ්ඩායමකට සාක්ෂාත් කරගත හැකි දෑ කෙතරම් වේ දැයි සිතා බලන්න. ගෝතමාලාවේ තිබෙන්නාක් වැනි ස්වාධීන ජාත්‍යන්තර විමර්ශන ඒකකයක් පිහිටුවීම සඳහා ආණ්ඩුවට උපකාර කිරීමට අප ආරම්භයේ පටන්ම ඉදිරිපත් වුනත්, කිසිවිටෙකත් අපට ඔවුන්ගෙන් පිළිතුරක් ලැබුනේ නැත. ගැඹුරට කිඳා බැස ඇති මේ පීඩක ව්‍යුහයන් ගලවා දැමීම අතිශයින් තීරණාත්මකය. එසේ නැතහොත් සිදුවන්නේ මේ කැබලි වී, කුරිරු බවට ගොදුරු වුනු පීඩිතයන් ගණනින් වැඩිවීම පමණකි,"* යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය,

**වධහිංසාව දිගටම**

පුනරුත්ථාපන කටයුතු පිළිබඳ බ්‍රිතාන්‍යයේ ප්‍රධානතම ස්වේච්ඡා සංවිධානය වන වධහිංසාවෙන් නිදහස (Freedom From Torture) එළිදක්වා ඇති ශ්‍රී ලංකාවේ පොලිසිය හා යුද හමුදුව විසින් දිගටම වධහිංසා පැමිණවීම පිළිබඳ අලුත්ම වාර්තාවට පදනම් වී ඇත්තේ 2015-17 අතර කාලයේ වධබන්ධන ගැන වින්දිතයන් 16 දෙනකු නගන චෝදනාය. 2015-17 කාලයේ ඒ හා සමාන සිදුවීම් 76ක් ITJP විසින් මීට ඉහතදී ලේඛනගත කර තිබේ. දිගින් දිගටම සිදුවන වධහිංසා සහ පුරුෂ ලිංගික දූෂණ පිළිබඳ සම්මුඛ සාකච්ඡා 20 ක් සහ වෛද්‍ය වාර්තා 32ක් ඇසුරින් ඇසෝෂියේටඩ් ප්‍රෙස් පුවත් සේවාව විසින් 2017 දී මුල් පෙලේ ගවේෂණාත්මක වාර්තාවක් පල කරන ලදී.

*“ආරක්ෂක අංශ විසින් සිදුකරනු ලබන සංවිධානාත්මක වධබන්ධන විස්තර කරන ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ වාර්තාව පවසන පරිදි ලිංගික ප්‍රචණ්ඩතාව “ආයතනික ප්‍රතිපත්තියකි[1]”. බන්ධනාගාරයට කිහිප වාරයක් ගිය පමණින් නීති විරෝධී රඳවා තබා ගැනීම් සහ වධබන්ධන ඔහේ නැතිව යන්නේ නැත. චූදිත අපරාධකරුවන් සහ අණදෙන නිලධාරීන්ගේ වැඩ අත් හිටුවා, විමර්ශන සිදුකොට, නඩු පැවරිය යුතුය,”* යි සූකා මහත්මිය පැවසුවාය.

**වහාම ගත යුතු පියවර**

වධහිංසාව වලක්වාලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව බරපතල ලෙස සලකන්නේ නම්, අනික් බොහෝ දෙනකු සමගින්, පහත දැක්වෙන නම් දැරූ පුද්ගලයන්ගේද වැඩ අත්හිටුවා, වහාම විමර්ශන ආරම්භ කළ යුතුය:

1. **නන්දන මුණසිංහ:** පොලිස් වධහිංසාවට අදාලව ඔහු ඇතුළු නමින් සඳහන් කරන ලද ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ (TID) නිලධාරීන් සම්බන්ධයෙන් වහාම පරීක්ෂණ ආරම්භ කරන ලෙස වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත මැන්ෆ්‍රඩ් නොවැක් 2007 දී ඉල්ලා තිබුනි[2]. ඒ නොතකා නැවත නැවතත් උසස් කරනු ලැබූ ඔහු දැන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකි. ශ්‍රී ලංකාවේ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇති ආයතනයට ඔහු 2016 දී පත් කරනු ලැබීමත්, සුදු වෑන් පැහැරගැනීමේ උත්සාහයක් සම්බන්ධ පරීක්ෂණ භාරව 2017 දී ඔහු පත් කිරීමත් විස්මය දනවයි.

2. **සිසිර මෙන්ඩිස්[3]:** කුප්‍රකට හතරවැනි තට්ටුව භාරව සිටි තැනැත්තා ලෙස මොහු මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලයේ 2015 වාර්තාවේ[4] නම් කර තිබේ. මෙය වෙනත් අය මෙන්ම, ප්‍රකට මාධ්‍යවේදීන් ගණනාවක්ද රඳවා තබාගෙන වධහිංසා කරන ලද ස්ථානයකි. විශ්‍රාම ගොස් සිටි මෙන්ඩිස් මහතා ආපසු කැඳවූ හවුල් ආණ්ඩුව විසින් ඔහු ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පිහිටි ජාතික බුද්ධි මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වරයා ලෙස පත් කර, වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව හමුවට 2017 පැමිණි රජයේ නියෝජිත මණ්ඩලයේ සාමාජිකයකු කර එවන ලදී. “බිහිසුණු සිද්ධි ගණනාවක්ම සිදුවූ වකවානුවක් වන සිවිල් යුද්ධය අවසානයේ කෙලෙසීම් සම්බන්ධයෙන් රටේ වඩාත් කුප්‍රකට මධ්‍යස්ථානයේ විධාන වගකීම දැරුවේ ඔහුය,” යි එජා කමිටුවේ ෆෙලීස් ගෙයර් නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පතට පවසා තිබුනි. මෙන්ඩිස් මහතාගේ කාර්ය භාරය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ

---

[1] Para 591 OISL 2015.

[2] “The Special Rapporteur recommended that prompt and independent investigations of all allegations of torture and ill-treatment be carried out in order to bring those responsible to justice (i.e. the alleged perpetrators, Inspector of Police Saman, Police Constable Perera, and the management of TID, including the Director of TID, Senior Superintendent of Police, Nandana Munasinghe, as well as the CID officers allegedly responsible for the ill-treatment of Nicholas Stephen).” http://www2.ohchr.org/english/bodies/hrcouncil/docs/7session/A.HRC.7.3.Add.6_ch.pdf

[3] The Case Against Sisira Mendis, ITJP, Nov 2016, http://www.itjpsl.com/assets/press/The-case-against-Sisira-Mendis-final.pdf

[4] A/HRC/30/CRP.2, Para 553.

කමිටුව නිල වශයෙන් විමසන ලද ප්‍රශ්න වලට ශ්‍රී ලංකාව තවමත් උත්තර දී නැත.

3. **ජගත් ජයසූරිය**: ජෝසප් කඳවුරේ අණදෙන නිලධාරියා ලෙස ඔහු 2007 අගෝස්තු 7 ද සිට 2009 ජූලි 14 ද දක්වා රටේ වඩාත් කුප්‍රකට වධකාගාරයක් භාරව සිටියේය. වධබන්ධන සහ වෙනත් බරපතල කෙලෙසීම් සම්බන්ධයෙන් ඔහුට එරෙහිව ITJP විසින් 2017 දී ලතින් ඇමරිකාවේ ජාත්‍යන්තර නඩු කිහිපයක් පවරන ලදී.

4. **ශවේන්ද්‍ර සිල්වා:** යුද්ධය අවසානයේ ඔහුගේ භටයන් විසින් දෙමළ රැඳවියන්ට වධහිංසා කිරීම  අනුමත කළ බවට චෝදනා ලබන්නෙකි. යුද්ද අපරාධ පිළිබඳව දිගින් දිගටම නැගී තිබූ චෝදනා නොතකා 2019 දී යුද හමුදු මාණ්ඩලික ප්‍රධානී තනතුරට උසස් කරන ලදී.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT